[සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப்பதிப்புரிமையுடையது / All Rights

# මතුගම අධ්‍යාපන කලාපය

මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம்

## දෙවන වාර ඇගයීම - 2023

| 06 ශ්‍රේණිය | විද්‍යාව | පත්‍රය I/II | පැය - 2 යි. |
|---|---|---|---|

නම ........................................................................................................................................

**සැළකිය යුතුයි.**

- **සියළුම ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.**
- **1 සිට 20 දක්වා ප්‍රශ්න සඳහා නිවැරදි හෝ වඩාත්ම ගැලපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01). පහත ද්‍රව්‍ය අතරින් ජීවී ද්‍රව්‍ය පමණක් ඇති පිළිතුර තෝරන්න,

1). ළමයා, අඹගස, පොත
2). පූසා, මෑ වැල, පොල් ගස
3). පොත, ගිරවා, බල්ලා
4). ජලය, බයිසිකලය, පූසා

02). සංචරණයක් හෝ චලනයක් දක්නට නොලැබෙන්නේ,

1). මුහුදු මල
2). නිදිකුම්බා
3). හැකරැල්ලා
4). බයිසිකලය

03). රූපයෙන් පෙන්නුම් කරන්නේ ජීවියකු සතු කුමන ලක්ෂණයද?



1). වර්ධනය
2). ප්‍රජනනය
3). පෝෂණය
4). ශ්වසනය

04). තන්තු කම්පනයෙන් ශබ්දය නිපදවෙන සංගීත භාණ්ඩ ඇතුලත් පිළිතුර වන්නේ,

1). ගිටාරය, සිතාරය
2). උඩැක්කිය, දවුල
3). බටනලාව, ගිටාරය
4). හක්ගෙඩිය, බටනලාව


05). යම් වස්තුවක අඩංගු පදාර්ථ ප්‍රමාණය හඳුන්වන්නේ,

1). ස්කන්ධය ලෙස
2). බර ලෙස
3). පරිමාව ලෙස
4). ඝනත්වය ලෙස

06). නිදහසේ එල්ලා ඇති දණ්ඩ චුම්බකයක උත්තර ධ්‍රැවය සෑමවිටම යොමු වන්නේ,

1). පෘථිවියේ උතුරටය
2). පෘථිවියේ බටහිරටය
3). පෘථිවියේ දකුණටය
4). පෘථිවියේ නැගෙනහිරටය.

07). සමාන ජල පරිමා විවිධ හැඩයේ භාජන හතරක ඇති අයුරු පහත දැක්වේ. මින් පැහැදිලි කළ හැක්කේ,



1). ජලයට නිශ්චිත හැඩයක් ඇති බවයි.
2). ජලය ඕනෑම භාජනයකට දැමිය හැකි බවයි.
3). ජලය අඩංගු භාජනයේ හැඩය ගන්නා බවයි.
4). ජලය ද්‍රව අවස්ථාවේ පවතින බවයි.

08). රිද්මයානුකූල අවිධිමත් ශබ්ද හඳුන්වන්නේ,...............................ලෙසය.

1). ඝෝංකාරය 2). ඝෝෂාව 3). සංගීතය 4). හඬේ සැර





LIVEWORKSHEETS

09). A – ශාකවල ආහාර නිෂ්පාදනය
B – පෙනීම ලබාදීමට
C – මාර්ග සංඥා නිකුත් කිරීමට
ඉහත ප්‍රකාශ අතුරින් ආලෝකයේ ප්‍රයෝජනයක් වන්නේ,
1). A පමණි 2). A හා B පමණි 3). B හා C පමණි 4). A , B, C සියල්ල.

**10 සහ 11 ප්‍රශ්න වලට පිළිතුරු සැපයීම සඳහා පහත රූපසටහන උපයෝගී කර ගන්න.**



10). ඉහත ක්‍රියාකාරකමේදී ලැබෙන නිරීක්ෂණ අනුපිළිවෙලින් සඳහන් පිළිතුර තෝරන්න.
1). අයිස් → ජල වාෂ්ප → ජලය
2). ජලය → අයිස් → ජල වාෂ්ප
3). ජල වාෂ්ප → ජලය → අයිස්
4). අයිස් → ජලය → ජල වාෂ්ප

11). ඉහත අවස්ථා විපර්යාස සිදුවන්නේ ඉටිපන්දම් දැල්ලෙන් ලැබෙන,
1). තාපය නිසාය 2). උෂ්ණත්වය නිසාය
3). ආලෝකය නිසාය 4). ස්පර්ශය නිසාය

12). ප්‍රශ්වාස වතයේ වැඩිපුර අඩංගු වන වායුව වන්නේ,
1). කාබන්ඩයොක්සයිඩ් වායුව 2). ඔක්සිජන් වායුව
3). නයිට්‍රජන් වායුව 4). හයිඩ්‍රජන් වායුව

13). චුම්බකයක චුම්බක ගුණ වැඩියෙන්ම පවතින ස්ථාන වන්නේ,
1). උත්තර ධ්‍රැවයේ ය. 2). චුම්භකයේ මැදය
3). දක්ෂිණ ධ්‍රැවයේ ය. 4). ධ්‍රැව දෙකෙහිය.

14). මුහුදු රළ වල ඇති ශක්තිය නිසා ඇතිවන අයහපත් ප්‍රතිඵලයකි.
1). විද්‍යුත් ශක්තිය නිපදවා ගත හැකි වීම.
2). මුහුදු වෙරළ සුන්දර වීම
3). මුහුදේ පාවෙන විදුලි බලාගාර ඇති කිරීමට හැකිවීම
4). සුනාමි තත්ව ඇතිවීම

15). විවිධ සංඥා නිකුත් කිරීමට ආලෝකය යොදා ගන්නා අවස්ථා ඇත. බොහෝ විට අනතුරක් හැඟවීමට යොදා ගන්නේ,
1). රතු ආලෝකය 2). කොළ ආලෝකය 3). නිල් ආලෝකය 4). කහ ආලෝකය

16). පෘථිවි පෘෂ්ඨයේ ඇති ජලයෙන් අපට පරිභෝජනය කළ හැකි ජල ප්‍රතිශතය වන්නේ,
1). 0.01% 2). 70% 3). 97.14% 4). 10%

17). භූගත ජලය පවතින ආකාරයකි.
1). සාගර ජලය 2). පොකුණු ජලය 3). උල්පත් ජලය 4). ගංගා ජලය

18). ගල් අඟුරු, පෙට්‍රෝලියම් තෙල් වර්ග, පෙට්‍රෝලියම් වායු ආදී සියල්ලම,
1). ජෛව ඉන්ධන වේ. 2). පොසිල ඉන්ධන වේ.
3). ජෛව ස්කන්ධ වේ. 4). භූතාප ශක්තීන් වේ.

19). කලපු වල අඩංගු ජලය හඳුන්වන්නේ,
1). කරදිය 2). මිරිදිය 3). කිවුල්දිය 4). බොරදිය

20). ශාක සහ සතුන් අතර නිවැරදි වෙනස්කමක් ලෙස සැලකිය හැක්කේ,
1). සතුන්ට ආහාර අවශ්‍ය නමුත් ශාකවලට ආහාර අවශ්‍ය නොවීම.
2). සතුන්ට ආහාර හා ජලය අවශ්‍ය නමුත් ශාකවලට ආහාර හා ජලය අවශ්‍ය නොවීම.
3). ශාක චලනය නොකරන නමුත් සතුන් චලනය කිරීම.
4). ශාක ආහාර නිපදවන නමුත් සතුන් ආහාර නිපද වීමක් නොකිරීම.




LIVEWORKSHEETS